**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංග කලා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2015**

**විෂයමාලා න්‍යාය සහ පරිචය – ESU3129**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 අප්‍රේල් 07** **වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. විෂයමාලාව යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

02. විෂයමාලා සංවර්ධන ආකෘතියක් යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

03. විෂයමාලා ඇගයීම යනුවෙන් කුමක් අදහස්වේ දැයි පැහැදිලි කරන්න.

04. විෂයමාලා අධ්‍යයනය ගුරුවරයාට වැදගත් බව පෙන්වීමට හේතු හතරක් (04) ලියන්න.

05. වර්ෂ 1981 ධවල පත්‍රිකාව මඟින් සිදු වූ විෂයමාලා ප්‍රතිසංස්කරණ තුනක් (03) ලියන්න.

06. විෂයමාලා සැලසුම් කිරීමේදී සහ සංවර්ධනය කිරීමේදී දාර්ශනික මත උපයෝගී කර ගැනීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

07. පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට විෂය සමගාමී ක්‍රියාකාරකම්වලින් ඇති ප්‍රයෝජන තුනක් (03) කෙටියෙන් සාකච්ඡා කරන්න.

08. විෂයමාලා සම්පාදනයේ දි අවශ්‍යතා න්‍යාය උපයෝගී කර ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) විෂයමාලා කළමනාකරණය යනුවෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 05)

(ii) විෂයමාලා කළමනාකරණයේ අවස්ථා පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii) පාසල් මට්ටමේදී විෂයමාලා කළමනාකරණය වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

10. (i) පියාජේ විසින් ඉදිරිපත් කරන ලද මනෝවිද්‍යාත්මක අදහස් විෂයමාලා සැළසුම් කිරීම සහ සංවිධානය කිරීමේදී වැදගත්වන අයුරු සාකච්ජා කරන්න. (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික විෂයමාලාව සැළසුම් කිරීම හා සංවිධානය කිරීමේ දී එම අදහස් කෙතෙක් දුරට සැළකිල්ලට ගෙන ඇත්දැයි පරීක්‍ෂා කරන්න. (ලකුණු 10)

11. (i) ටයිලර්ගේ විෂයමාලා ආකෘතිය පැහැදිලි කර, එහි දුබලතා හඳුනාගන්න. (ලකුණු 10)

(ii) එම දුබලතා වීලර්ගේ ආකෘතියෙන් මඟහරවා ගත හැක්කේ කෙසේදැයි පරීක්‍ෂා කරන්න. (ලකුණු 10)

12. (i) විෂයමාලා සංවර්ධන ප්‍රවේශ හතර (04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(ii) ඉන් එක් ප්‍රවේශයක් තෝරාගෙන එහි ස්වභාවය, කැපී පෙනෙන ලක්‍ෂණ, වැදගත්කම සහ දුර්වලතා සාකච්ජා කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව සංවිධානයේ දී භාවිතයට ගෙන ඇති විෂයමාලා සංවිධාන ප්‍රවේශ පරීක්‍ෂා කරන්න. (ලකුණු 08)

13. (i) පාසල් විෂයමාලාවක් සැකසීමේදී සළකා බැලිය යුතු සමාජ විද්‍යාත්මක සාධක තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(ii) සමාජ වෙනස්වීම අනුව පාසල් විෂයමාලාව වෙනස්විය යුතු බව නිදසුන් ඇසුරින් සනාථ කරන්න. (ලකුණු 08)

(iii) පාසල සමාජ සංවර්ධන කේන්ද්‍රයක් විය යුත්තේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

14. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.

(i) 1972 විෂයමාලා ප්‍රතිසංස්කරණ කෙරෙහි බලපෑ පසුබිම

(ii) හන්දෙස්ස අධ්‍යාපන ක්‍රමය

(iii) විෂයමාලාවේ තිරස් හා සිරස් සමෝධානය

(iv) විෂය සන්ධාරය තේරීමේ නිර්ණායක

(ලකුණු 2 x 10 = 20)

හිමිකම් ඇවිරිණි.